**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය - 2015**

**-----------------------------------------------------------**

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩල පනතේ 12 වන වගන්තියේ 3 උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහල සතු වත්කම් අයිතම 9 ක් වැඩිදියුණු කිරීම වෙනුවෙන් වැයකර තිබුණු රු.4,258,177 ක මුදල ප්‍රාග්ධනගත නොකර පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,678,856,148 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවයේ යෙදී සිටින සේවකයින් 21 දෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන වෙන් නොකිරීම හා 2015 දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටි සේවකයින් 113 දෙනෙකු වෙනුවෙන් අධි ප්‍රතිපාදන සිදුකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදන වියදම රු.1,788,516 කින් වැඩියෙන් ගිණුම්ගතවී තිබුණු අතර සේවයෙන් ඉවත්වූ නිලධාරිනියකට වැඩිපුර ගෙවා තිබුණු රු.115,868 ක පාරිතෝෂික දීමනාව ආපසු අයකර ගත යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී සේවයෙන් ඉවත්වූ සේවකයෙකුට සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.65,383 ක පාරිතෝෂික දීමනාව ගෙවිය යුතු පාරිතෝෂික දීමනා ගිණුමට හර නොකර පාරිතෝෂික දීමනා වියදම් ගිණුමට හර කර තිබුණි.

(ඇ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය රු.18,191,156 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) රෝහල ආරම්භ කළ දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දේශීය පරිත්‍යාගශීලීන්ගෙන් ලැබී තිබුණු විවිධ ජංගම නොවන වත්කම්වල සාධාරණ අගය ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු උපකරණ ඒකක 44 ක හා ඉන්වෙන්ට්‍රි අයිතම 4,493 ක සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) නව හෙද නේවාසිකාගාරය ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවා තිබුණු රු.2,133,975 ක උපදේශක සේවා ගාස්තුව කෙරීගෙන යන වැඩ ගිණුමට හර නොකර පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී උපචිත පදනම මත ගිණුම් පිළියෙල කර ඇති බව ගිණුම් සටහන් මගින් දක්වා ඇතත් සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,610,060 ක උපචිත වියදම් හා රු.217,056 ක ඉදිරියට ගෙවූ වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වූ වෙළඳ තොගයේ හා කල් ඉකුත් වූ තොගවල පිරිවැය පිළිවෙලින් රු.591,575 ක් හා රු. 679,322 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පහත සඳහන් විෂයයන්වලට අදාළව මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනු හා ලේඛන අනුව රු.13,211,360 ක වෙනසක් පැවති නමුත් වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.

| විස්තරය | විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනුව / ලේඛනය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | ලිපිගොනුව/ ලේඛනය අනුව වටිනාකම | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| වර්ෂය තුළ මිලදී ගත් ජංගම නොවන වත්කම්වල පිරිවැය | ස්ථාවර වත්කම් ලේඛනය | 300,039,300 | 287,472,439 | 12,566,861 |
| ජනාධිපති අරමුදලින් 2015 සැප්තැම්බර් 30 දිනට අයවිය යුතු රෝහල් ගාස්තු | රෝහල් ගාස්තුවලට අදාළ ලිපි ගොනුව | 11,920,902 | 11,620,902 | 300,000 |
| රක්ෂණ සමාගම් 8 කින් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රෝහල් ගාස්තු | රක්ෂණ සමාගම්වල රෝහල් ගාස්තුවලට අදාළ ලේඛනය | 10,150,639 | 9,914,766 | 235,873 |
| 2015 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 10 දෙනෙකුගේ ආපදා ණය | ණය ලේඛනය | 1,398,166 | 1,506,792 | 108,626 |
| | | | | 13,211,360 |

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගිම් ගිණුම් ශේෂ 6 ක එකතු වටිනාකම හා ඒ වෙනුවෙන් ලැබුණු ශේෂ සනාථ සහතිකවල එකතු වටිනාකම අතර රු.7,492,933 ක වෙනසක් පැවති නමුත් වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ගිණුම්වලින් ඉවත්කළ ජංගම නොවන වත්කම් | 29,287,000 | අපහරණය කිරීම සඳහා ගිණුම්වලින් ඉවත් කළ ජංගම නොවන වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂයවල නිවැරදිතාවය තහවුරුකර ගැනීමට ලිඛිත සාක්ෂි. |
| (ආ) | ගිණුම්වලින් ඉවත්කළ ජංගම නොවන වත්කම් | 2,268,500 | වත්කම් අපහරණයට අදාළ අපහරණ මණ්ඩලයේ නිර්දේශ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය. |
| (ඇ) | ණයහිමි ශේෂ 115 | 132,220,019 | ශේෂ සනාථ කිරීම. |
| (ඈ) | අයවිය යුතු රෝහල් ගාස්තු | 11,307,230 | |
| (ඉ) | වෛද්‍ය සැපයීම් අංශයට ගෙවිය යුතු වටිනාකම | 41,688,054 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආයතන 03 කින් ලැබිය යුතු රෝහල් ගාස්තු රු.6,349,313 ක්ද, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු සීමාවාසික වෛද්‍යවරුන්ට ගෙවූ වැටුප් රු.1,112,280 ක්ද, පෞද්ගලික ආයතන 03 කින් ලැබිය යුතු විදුලි ගාස්තු රු.78,675 ක්ද වශයෙන් එකතුව රු.7,540,268 ක් අයකර ගැනීමට වර්ෂ 2 ත් වර්ෂ 6 ත් අතර කාලයක සිට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විගණන ගාස්තු රු.2,453,571 ක් වර්ෂ 2 ත් වර්ෂ 5 ත් අතර කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මිලදී ගත් වෛද්‍ය සැපයුම් වෙනුවෙන් රු.10,838,120 ක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතද, රු.437,799 ක ජල ගාස්තු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතද වර්ෂ 5 කට වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට වෛද්‍යවරුන් වෙත නිරවුල්කර නොතිබුණු වෘත්තීය ගාස්තු රු.3,616,142 ක් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) VII පරිච්ඡේදයේ 4 හා 5 වගන්ති | ලිපිකරු තනතුරේ නිලධාරීන් 4 දෙනෙකු වෙත විද්‍යුත් බන්තු රේඛන ශිල්පී තනතුරේ III වන ශ්‍රේණියට පත්වීම් ලබාදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව විද්‍යුත් බන්තු රේඛන |

| | |
|---|---|
| | ශිල්පී තනතුරේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවරක තබා තිබුණි. තවද තනතුරට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී නොතිබුණු නමුත් අඛණ්ඩව වැටුප් වර්ධක එම නිලධාරීන්ට ගෙවා තිබුණි. |
| (ii)XXX පරිච්ඡේදයේ 4.1 වගන්තිය | විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රෝහලේ වෛද්‍යවරු 6 දෙනෙකු ඇතුළු නිලධාරීන් 9 දෙනෙකු 2013, 2014 හා 2015 නොවැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදයේ රාජකාරී වේලාවන් තුළදී සෞඛ්‍ය අධ්‍යයන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ දේශන පැවැත්වීම සඳහා සහභාගීවී ඒ සඳහා එකතුව රු.877,125 ක දීමනා ලබාගෙන තිබුණි. |
| **(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | ස්ථාවර වත්කම් ගිණුම් තැබීමේදී විධිමත් කාර්ය පරිපාටියක් අනුගමනය කිරීමට හා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට රෝහල කටයුතු කර නොතිබුණි. |
| **(ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය.** | සියළුම ශ්‍රේණිවල බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අදාළ අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂමේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් පිළියෙල කර තිබුණු බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටි සඳහා අදාළ නිර්දේශය හා අනුමැතිය ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රෝහල් මණ්ඩලයේ මෙහෙයුම්වලින් රු.352,618,182 ක බදු පසු ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.720,613,254 ක බදු පසු අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,073,231,436 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදානය රු.779,914,000 කින් අඩුවීමද කාර්ය මණ්ඩල පිරිවැය රු.299,119,863 කින් වැඩිවීමද ඌනතාවයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ඌනතාවයක් පැවැති නමුත් 2013 හා 2014 වර්ෂවල මූල්‍ය අතිරික්තයක් ඇතිවී නැවත 2015 වර්ෂයේදී මූල්‍ය ඌනතාවක් ඇතිවී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී මණ්ඩලයේ සමස්ථ දායකත්වය 2012 සිට 2014 දක්වා රු.716,896,615 සිට රු.1,739,662,005 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. කෙසේ වුවත් සමාලෝචිත වර්ෂයේදී සමස්ථ දායකත්වය රු.950,142,035 දක්වා අඩුවී තිබුණු අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.789,519,970 කින් අඩුවීමක් විය.

## 3.2 රෝහලට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

රෝහල් කාර්ය මණ්ඩලයේ පුද්ගලයින් 06 දෙනෙකු විසින් වයස එළඹීමට පෙර විශ්‍රාම ගැන්වීම, උසස්වීම් නොලැබීම හා මුදල් වංචා හේතුවෙන් සේවයෙන් පහ කිරීම ආදී කරුණු මත රු.මිලියන 11 ක්ද, බාහිර පුද්ගලයන් 02 දෙනෙක් විසින් රෝගී සත්කාර සේවාවන්හි පැවති දුර්වලතා හේතුකොට ගෙන රු.මිලියන 62.5 ක්ද වන්දි ඉල්ලා රෝහලට එරෙහිව අධිකරණවල පිළිවෙලින් නඩු 06 ක් හා නඩු 02 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ජයවර්ධනපුර රෝහල සහ තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය එක්ව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්මික අංශයේ පුහුණු වැඩසටහන් ස්ථාපිත කිරීමේ අරමුණින්, සෞඛ්‍ය අධ්‍යයන විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවීමට 2013 මැයි 09 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම ප්‍රකාරව, 2013 ඔක්තෝබර් මාසයේදී රෝහල් පරිශ්‍රයෙහි පිහිටුවා තිබුණු මෙම ආයතනයෙහි ජල හා විදුලි ගාස්තු රෝහල විසින් වැයකර තිබුණි. කෙසේ වෙතත් 2016 මැයි 09 දිනට අදාළ අවබෝධතා ගිවිසුම අවලංගුවී තිබුණු බැවින් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවයක් තිබීම පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණු අතර විද්‍යායතනය විධිමත් පදනමකින් පිහිටුවාලීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.546,490 ක් වූ ඖෂධ වර්ග 11 ක ඒකක 12,322 ක් හා පිරිවැය රු.5,686,759 ක් වූ ශල්‍ය ද්‍රව්‍ය හා විකිරණශීලී ද්‍රව්‍ය වර්ග 32 ක ඒකක 4,778 ක් කෙටි කාලයකදී කල් ඉකුත් වන හා චලනය නොවන අයිතම ලෙස ගබඩාවල පැවතුනි. ඊට අමතරව සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.585,643 ක් වූ ශල්‍ය ද්‍රව්‍ය හා ඖෂධ වර්ග 12 ක ඒකක 2,208 කින් එකම ඒකකයක් හෝ වර්ෂය තුළදී භාවිතා කර නොතිබුණි. මෙම ඖෂධ භාවිතයට ගැනීම කෙරෙහි නිසි අවධානය යොමු කර නොතිබුණු අතර අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමකින් තොරව මිලදී ගැනීම, භාවිතයට ගැනීමට ඖෂධ අයිතම නම් කළ ශල්‍ය වෛද්‍යවරයා විශ්‍රාම යාම හා නව ශල්‍යවෛද්‍යවරයා ඒවා භාවිතයට ගැනීමට නියම නොකිරීම වැනි කරුණු මෙවැනි තොග පැවතීමට හේතුවී තිබුණි.

(ඇ) අභ්‍යන්තර ඖෂධ ගබඩාවේ හා ශල්‍ය ද්‍රව්‍ය ගබඩාවේ, පිරිවැය රු.973,665 ක් වූ ඖෂධ වර්ග 24 ක ඒකක 1,658 ක් හා පිරිවැය රු.143,782 ක් වූ ශල්‍ය ද්‍රව්‍ය වර්ග 18 ක ඒකක 2,321 ක් මූලාශ්‍ර ලියවිලිවලින් තොරව තොග ලේඛනවලට ඇතුළත්කර තිබුණි.

(ඈ) 2015 ජූලි 08 දිනට පැවති තොග, ප්‍රථම වරට පරිගණකගත කර තිබුණු නමුත් එදිනට භෞතික තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. එදිනට තොග ලේඛනයන්ට අනුව ශල්‍ය ද්‍රව්‍ය වර්ග 152 ක ඒකක 388,016 ක් පැවති නමුත් පරිගණක දත්ත අනුව එය ඒකක 412,755 ක් විය. ඒකක 44,047 ක තොග අතිරික්තයක්ද ඒකක 21,683 ක තොග ඌනතාවයක්ද පැවති නමුත් ඒවාට හේතු සොයා බැලීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පවරාදිය යුතු විශේෂිත රාජකාරිය හා ඒ වෙනුවෙන් මාසිකව වැටුප් හා දීමනා ගෙවිය යුතු පදනම හඳුනා නොගෙන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව වයස අවුරුදු 68 ඉක්ම වූ විශ්‍රාමික විකිරණ ශිල්පීන් දෙදෙනෙකු වර්ෂයකට කාර්ය පැවරුම් පදනම මත 2015 අගෝස්තු 21 හා 25 යන දිනයන්හි බඳවාගෙන තිබුණි. 2007 මැයි 11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව, විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවයේ යොදවනු ලබන විට විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් සියයට 50 ක් හෝ රු.15,000 ක් යන දෙකින් වැඩි මුදල මාසික දීමනාවක් ලෙස ගෙවිය හැකි නමුත් ඊට පටහැනිව 2015 ජූලි සිට 2016 ජනවාරි දක්වා කාලය තුළදී එම නිලධාරීන් දෙදෙනාට පිළිවෙලින් රු.358,680 ක් හා රු.215,698 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) 2014 මාර්තු 19 දින පරිත්‍යාග ලෙස ලැබී වර්ෂයකට වඩා අඩු කාලයක් භාවිතා කර තිබුණු නිර්වින්දන යන්ත්‍ර 3 ක් දෝෂ සහගත යැයි දක්වා අපහරණය කර ඒ වෙනුවට රු.29,900,000 ක් වැය කර නව නිර්වින්දන යන්ත්‍ර 4 ක් 2015 අගෝස්තු 14 දින මිලදී ගෙන තිබුණි. පැරණි යන්ත්‍ර 3 අපහරණය කිරීමට ඒවා දෝෂ සහගතද යන්න පිළිබඳව තාක්ෂණික සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශ ලබා ගෙන නොතිබුණු අතර මීගමුව, කළුතර හා මොණරාගල දිස්ත්‍රික් රෝහල් වෙත ලබාදී තිබුණු එම යන්ත්‍ර 3 කිසිදු දෝෂයකින් තොරව භාවිතා කරන බව විගණනයට තහවුරු විය.

ඕස්ට්‍රේලියාවේ “Royal Perth “රෝහලේ 2015 අප්‍රේල් 21 දිනැති ලිපියෙන් නිර්වින්දන නව යන්ත්‍ර 4 ක් පරිත්‍යාග ලෙස ලබා දෙන බව දන්වා තිබියදී ඉහත නව යන්ත්‍ර 4 මිලදී ගැනීම සඳහා 2015 මැයි 14 දින ගැණුම් ඇණවුම යවා තිබුණි. පරිත්‍යාග ලෙස නව යන්ත්‍ර 4 ක් ලැබෙන බව දැනුවත්ව රු.29,900,000 ක් වැය කර යන්ත්‍ර 4 ක් මිලදී ගෙන තිබුණු අතර පරිත්‍යාග ලෙස ලැබුණු යන්ත්‍ර 4 2016 අගෝස්තු 22 වන විටත් නිශ්කාර්යව රෝහලේ තිබුණි. කෙසේ වෙතත් පරිත්‍යාග ලෙස ලැබුණු යන්ත්‍ර 4 දෝෂ සහිත බැවින් ප්‍රයෝජනයට ගත නොහැකි බව සභාපතිවරයා විගණනයට දන්වා තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**---------------------------**

රෝහලේ සිදු කරනු ලබන ශල්‍යකර්ම හා රෝගී ප්‍රතිකාර සඳහා රෝගීන්ගෙන් වෘත්තීය ගාස්තු අයකර එම ගාස්තුවෙන් සියයට 99.85 ක් ශල්‍ය කර්මය සඳහා සහභාගීවූ විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් හා සහාය කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. 2015 වර්ෂය තුළදී පමණක් එසේ ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තුව රු.243,870,143 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සාමාන්‍ය රාජකාරී වේලාවෙන් බැහැරව වෛද්‍යවරුන්ට පෞද්ගලික සේවයේ යෙදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු නමුත් අයකළ හැකි වෘත්තීය ගාස්තු වටිනාකම හෝ වෛද්‍යවරුන් හා සහායක කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන වටිනාකම හා එය ගණනය කරනු ලබන ආකාරය පිළිබඳව නිශ්චිත ක්‍රමවේදයක් කළමනාකරණය විසින් පිළියෙල කර නොතිබුණු අතර අදාළ ශල්‍ය වෛද්‍යවරයා විසින් තම පෞද්ගලික අභිමතය පරිදි අය කරනු ලබන වෘත්තීය ගාස්තු ප්‍රමාණය තීරණය කර තිබුණි.

(ආ) සාමාන්‍ය රාජකාරි කාලය තුළ සිදු කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා වෘත්තීය ගාස්තු අයකළ නොහැකි වුවත්, වෛද්‍යවරු 14 දෙනෙකු විසින් 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සාමාන්‍ය රාජකාරි කාලය තුළ සිදුකර තිබුණු ශල්‍යකර්ම හා පරීක්ෂණ වෙනුවෙන් රු.1,917,075 ක වෘත්තීය ගාස්තු අයකර තිබුණි.

(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන ප්‍රකාරව, විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් හා සහායක කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණු වෘත්තීය ගාස්තු මත උපයන විට ගෙවීම් බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු නමුත් රෝහල් කළමනාකරණය විසින් වෘත්තීය ගාස්තු මත උපයන විට ගෙවීම් බදු අයකර නොතිබුණි. 2014 හා 2015 වර්ෂවලදී එසේ අයකර නොතිබුණු ඇස්තමේන්තුගත උපයන විට ගෙවීම් බදු වටිනාකම පිළිවෙලින් රු.35,367,508 ක් හා රු.39,377,486 ක් විය.

## 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 අප්‍රේල් සිට 2016 මාර්තු දක්වා කාල සීමාව තුළ රෝහල් උද්‍යාන නඩත්තුව හා අලංකරණ කටයුතු පවත්වාගෙන යාම සඳහා වූ ප්‍රසම්පාදනයේදී ලැබුණු අවම ලංසු තුන ප්‍රතික්ෂේප කර මාසයකට රු.588,800 ක් වූ හතරවන අවම ලංසුව තෝරාගත් කොන්ත්‍රාත්කරු ඉකුත් වර්ෂයේදීද මෙම කාර්යයේ කොන්ත්‍රාත්කරුවූ නමුත් ගිවිසුම් කොන්දේසිවලට අනුව සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාවෙන් සියයට 18 ක් හා පරීක්ෂකවරු සංඛ්‍යාවෙන් සියයට 5 ක් අඩුවෙන් සේවයේ යෙදවීම මෙම ප්‍රසම්පාදනයේදී නොසළකා හැර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළදී යොදවා සිටි මුළු සේවක සංඛ්‍යාව 2,994ක් වූ අතර එය සිටිය යුතු සේවක සංඛ්‍යාවෙන් සියයට 27.4 ක අඩු සංඛ්‍යාවක් විය.

(ආ) ඖෂධීය නාමය වෙනුවට වෙළඳ නාමයෙන් ඖෂධ මිලදීගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ වර්ග 8 ක ඒකක 23,534 ක් වෙළෙඳ නාමයෙන් මිලදී ගැනීමට වැයකර තිබුණු අතිරේක පිරිවැය රු.2,897,050 ක් බව නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය.

(ඇ) රෝහලේ රථගාල පුළුල් කිරීමේ කාර්යය රු.11,209,829 ක කොන්ත්‍රාත් වටිනාකමකට දින 112 කින් නිම කිරීමේ එකඟතාව මත 2012 සැප්තැම්බර් 05 දින කොන්ත්‍රාත් කරුවෙකුට පවරා තිබුණි. ගිවිසුම ප්‍රකාරව, 2013 ජනවාරි 09 දින වනවිට වැඩ අවසන් කළ යුතුව තිබුණු නමුත්, 2016 අගෝස්තු 22 දින වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණි. රථගාල පිරවීමට යොදාගත් පස් සාම්පලවල තත්ත්වය හා පස් තෙරපීමේ තත්ත්වය පිළිබඳ පරීක්ෂණවලින් (Soil Compaction Test) අසමත්වී තිබුණු අතර Expansion Joints හි තාර සහ වැලි මිශ්‍ර කර වසා දමා නොතිබුණි. සමස්ථ ප්‍රමාද කාලය වර්ෂ 3 කට අධික බැවින් අයකළ යුතු ප්‍රමාද ගාස්තුව රු.1,120,982 ක් වූ අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රු.995,454 ක් වූ 3 වන අතුරු බිල්පතට මුදල් නොගෙවා ප්‍රමාද ගාස්තු සඳහා හිලව් කිරීමට උපදේශකවරු නිර්දේශ කර තිබුණද එම නිර්දේශයෙන් වර්ෂ 1 මාස 06 කට පසු එම අතුරු බිල්පතට ගෙවීම්කර තිබුණි. කාලය ඉකුත් වීමට පෙර කාර්ය සාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට රෝහල කටයුතු කර නොතිබුණු අතර එය 2014 ඔක්තෝබර් 01 දින කල් ඉකුත්වී තිබුණි.

(ඈ) රෝහලට පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමේ කාර්යය 2010 වර්ෂයේදී රු.24,953,859 ක කොන්ත්‍රාත් වටිනාකමකට පෞද්ගලික ආයතනයකට පවරා තිබුණි. කොන්ත්‍රාත් කාලය සති 26 ක් වූ ඉහත කොන්ත්‍රාත්තුවේ භෞතික හා මූල්‍ය කාර්ය සාධනය පිළිවෙලින් සියයට 65 ක් හා සියයට 26 ක් පමණක් වන විට 2014 වර්ෂයේදී වැඩ අත්හැර දමා තිබුණි. එහි ඉතිරි වැඩ රු.8,250,000 ක කොන්ත්‍රාත් වටිනාකමකට මාස 6 කින් නිම කිරීමට වෙනත් කොන්ත්‍රාත් සමාගමකට 2014 දෙසැම්බර් මාසයේදී පවරා තිබුණි. නමුත් පළමු කොන්ත්‍රාත්තුවේ කාර්යයන්ද ඉටුකර තිබුණු පළමු කොන්ත්‍රාත් සමාගමේ හවුල්කාර ආයතනයක් වූ නව සමාගම විසින් මෙම මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යයෙහි වර්ෂ 4 කට වඩා වැඩි කාලයක් නිරතව සිටියද 2016 අගෝස්තු 22 දින වන විටත් එය නිම කිරීමට අසමත්වී තිබුණි. දෙවන කොන්ත්‍රාත්තුවේ ප්‍රමාද කාලය වර්ෂයකට වඩා වැඩිවී තිබුණු අතර

භෞතික කාර්ය සාධනය සියයට 90 ක් පමණක් බව වාර්තාකර තිබුණි. නමුත් ප්‍රමාද ගාස්තු අය කර ගැනීමේ කොන්දේසි ගිවිසුමට ඇතුළත්කර නොතිබුණු අතර කාර්ය සාධන ඇප බැඳුම්කරයක් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (i) ඡේදයේ සඳහන් සීමාව ඉක්මවා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් වූ රු.4,140,000 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ඇප බැඳුම්කරයක් ලබා ගැනීමෙන් තොරව ලබා දී තිබුණි.

(ඉ) රෝහලේ නව හෘද සත්කාර (Cardiology Building) ගොඩනැගිල්ලේ පිටත බිත්තියේ ජලය කාන්දුවීම වැළැක්වීමේ කාර්යය පවරා තිබුණු කොන්ත්‍රාත්කරුගෙන් වර්ෂ 3 ක වගකීම් සහතිකයක් ලබාගත යුතුවීමේ කොන්දේසියකට එළඹ තිබුණු නමුත් වගකීම් සහතිකයක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු.263,812 ක් පමණක් රඳවාගෙන සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකමින් ඉතිරිය වූ රු.2,374,312 ක මුදල කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

රෝහලේ විවිධ අංශ තුළ සමාලෝචිත වර්ෂය අවසානයට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති උපකරණ පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| අංශය | වත්කම් වර්ගය | ප්‍රමාණය | භාවිතයට ගත නොහැකිව පැවති කාලය |
|---|---|---|---|
| | | | වර්ෂ |
| රසායනාගාරය | රසායනාගාර උපකරණ | වර්ග 55ක ඒකක 72 | 2 සිට 25 දක්වා |
| සෞඛ්‍ය අධ්‍යාපන ඒකකය | උපකරණ | වර්ග 4ක ඒකක 4 | 13 කට වැඩි |
| ලේ බැංකුව | උපකරණ | ඒකක 2 | 1 කට වැඩි |
| වාට්ටු අංක 02 | උපකරණ | ඒකක 2 | 13 කට වැඩි |
| වෛද්‍ය වාර්තා අංශය | උපකරණ | වර්ග 2ක ඒකක 6 | 2 කට වැඩි |

ඉහත සඳහන් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින උපකරණ විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම සෞඛ්‍ය අධ්‍යාපන ඒකකය තුළ ඌන උපයෝජිත තත්ත්වයේ පවතින භාණ්ඩ ඒකක 3 ක්ද වර්ෂ 7 කට වැඩි කාලයක සිට ක්‍රියාකාරී තත්ත්වය හඳුනාගෙන භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ගබඩා 5 ක හා උප ගබඩාවල පැවති කල් ඉකුත් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය තොගවල මුළු පිරිවැය රු.5,415,699 ක් විය. විස්තර පහත දැක්වේ.

| කල් ඉකුත් වූ වර්ෂය | කල් ඉකුත් වූ ඖෂධවල පිරිවැය |
|---|---|
| ---------------------- | ----------------------- |
| | රු. |
| සමාලෝචිත වර්ෂය | 866,713 |
| වර්ෂ 1 සිට වර්ෂ 3 අතර | 268,170 |
| වර්ෂ 3 කට වැඩි | 162,716 |
| ඉකුත් වර්ෂවල පරිභෝජන රටාව පිළිබඳ අධ්‍යයනයකින් පසු නිවැරදි ඇස්තමේන්තු මත මිලදී නොගැනීම් නිසා කල් ඉකුත් වූ, ස්නායු ශලා ඒකකයට මිලදී ගත් ශලා ද්‍රව්‍ය තොග | 4,118,100 |
| | 5,415,699 |

කල් ඉකුත්වූ ඖෂධ හා ශලා ද්‍රව්‍ය තොග විධිමත් ලෙස විනාශකර පොත්වලින් ඉවත් කිරීමට, වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට හා කල් ඉකුත්වන ඖෂධ තොග ප්‍රමාණය අවමකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ඇතුළු ඉකුත් වර්ෂ 04 කදී වෛද්‍ය සැපයීම් අංශයෙන් මිලදී ගෙන තිබුණු මුළු පිරිවැය රු.301,443 ක්වූ ඖෂධ වර්ග 14 ක ඒකක 5,553 ක් තත්ත්වයෙන් අසමත්වී තිබුණු නමුත් එම වටිනාකම වෛද්‍ය සැපයුම් අංශයෙන් අයකර ගැනීමට හෝ ඒ වෙනුවට තත්ත්වයෙන් සමත් ඖෂධ ලබා ගැනීමට හෝ සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතුකර නොතිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 පෙබරවාරි 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී, රෝහලේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ගණකාධිකාරී යන ප්‍රධාන තනතුරුවල පැවති පුරප්පාඩු ස්ථිර වශයෙන් පිරවීමට සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඍජුව මැදිහත්වී කටයුතු කළ යුතු බව නියෝග කර තිබුණද, 2016 අගෝස්තු 22 දින දක්වාම එම තනතුරු සඳහා ස්ථිර නිළධාරීන් පත්කර නොතිබුණි.

(ආ) 2015 අගෝස්තු 10 දිනට වාට්ටු ලිපිකරු/ කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 9 ක් වුවද, ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත පිළිවෙලින් 9 දෙනෙකු හා 8 දෙනෙකු වශයෙන් එකතුව 17 දෙනෙකු වාට්ටු ලිපිකරු තනතුරට බඳවාගෙන තිබුණි. 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 ප්‍රකාරව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව හා අනුමත බඳවා ගැනීමේ පරිපාටියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් 8 දෙනාට 2015 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී ගෙවූ වැටුප් හා අතිකාල දීමනාවල එකතුව රු.1,771,766 ක් විය.

(ඇ) රෝහල් කාර්ය මණ්ඩලයේ වැටුප් වර්ධක අනුමත කිරීමට ප්‍රථම, සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය කුමක්ද හා එය සමත්ද යන බව සැළකා බැලීමක් කර නොතිබුණු අතර වැටුප් වර්ධක ආකෘතිපත්වල ඒ පිළිබඳව සඳහන් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාවූ කාලය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම 2015 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුණුගත එක් එක් කාර්යයන්ට අදාළ ඇස්තමේන්තුගත වටිනාකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ඉලක්ක හා අරමුණු අත්පත් කර ගැනීමේ ප්‍රගතිය මෙන්ම අයවැය ඇස්තමේන්තුව අනුව ඒ සඳහා වැය කළ මුදල හඳුනාගත හැකිවන පරිදි කාර්තුමය වශයෙන් ප්‍රගති වාර්තා පිළියෙල කර ඒවායේ පිටපත් අදාළ අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් රු.මිලියන 230 ක ප්‍රතිපාදන සළසා තිබුණු සංවර්ධන හා ඉදිකිරීම් කාර්යයන් 3 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භකර නොතිබුණි.

(ඈ) පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මට අනුව, 2014 හා 2015 වර්ෂවලදී ක්‍රියාත්මක කළයුතු, වෛද්‍යවරුන් සඳහා භෝජන ශාලාවක් ස්ථාපිත කිරීම, හෘද රෝගීන් සඳහා උසස් ප්‍රමිතියකින් යුක්තව රසායනාගාරයක් ඉදිකිරීම, නව මූල්‍ය හා පරිපාලන ගොඩනැගිල්ලක් ස්ථාපිත කිරීම යන කාර්යයන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණු මධ්‍යම වායු සමීකරණ පද්ධතිය නැවත සැකසීම හා විදුලිය සැපයීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම යන කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව සංයුක්ත සැලැස්මට අනුගතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත්කර නොතිබුණු භාණ්ඩ අයිතම 260 ක් එම වර්ෂයේදී මිලදී ගැනීමට වැයකර තිබුණු මුදල රු.95,940,345 ක් විය. අනුමත ප්‍රසම්පාදන සැලැස්මට අනුව, වෛද්‍ය උපකරණ ඒකක 27 ක ඇස්තමේන්තු ගත පිරිවැය සියයට 91 සිට සියයට 2,902 දක්වා පරාසයක ඉක්මවීම් සහිතව මිලදී ගෙන තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව, ක්‍රියාකාරී සැලැස්ම අනුව අත්කර ගැනීමට අපේක්ෂිත ඉලක්කවලට අදාළ වියදම ඇතුළත් වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණු වැය විෂයයන් 6 ක් වෙනුවෙන් රු.34,881,433 ක් වැයකර තිබුණි. වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු රු.3,450,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ඇ) ආදායම් විෂයයන් 5 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම අතර සියයට 49 සිට සියයට 707 දක්වා පරාසයක විචලනයන්ද, වැය විෂයයන් 8 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර සියයට 61 සිට සියයට 245 දක්වා පරාසයක විචලනයන්ද විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

ඉදිරි වර්ෂ 5 සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර විගණකාධිපතිට පිටපතක් සහිතව පොදු ව්‍යාපාර කාරක සභාවට මාසයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස 2016 පෙබරවාරි 10 දින පැවති රැස්වීමේදී රෝහල් මණ්ඩලයේ සභාපති වෙත නියෝග කළද 2016 අගෝස්තු 22 දින වන විටත් එම නියෝගයට අනුව කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර රෝහල් මණ්ඩලයේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | රෝහල සතුව පවත්නා සියලුම ස්ථාවර වත්කම් භෞතිකව හඳුනාගෙන වටිනාකම් තක්සේරු කර ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | තොග පාලනය | ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ගබඩා මෙන්ම අනෙකුත් උප ගබඩාවල තොග ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පාලනය | බඳවා ගැනීම්, උසස් කිරීම්, ශ්‍රේණිගත කිරීම් හා වැටුප් පරිමාණ සම්බන්ධ විධිමත් පරිපාටි හඳුන්වාදීමට හා අනුමත කර ගැනීමට කටයුතුකර නොතිබීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පාලනය | කොන්ත්‍රාත් සම්බන්ධ නිරන්තර සුපරීක්ෂණය, අධීක්ෂණය හා අවධානයට ලක් නොකිරීම. |
| (ඉ) | මිලදී ගැනීම් පාලනය | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදුනොකිරීම හා කොන්දේසි ප්‍රකාරව සැපයුම්කරුවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර නොතිබීම. |